友谊之桥

# සුභාසර

## චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

2012 නව වසරේ චීන රාජ්‍ය සභාපති හු චින් තාඕ මහතාගේ සුභපැතුම් පණිවිඩය

චීන ශ්‍රී ලංකා රාජ්‍යතන්ත්‍රික සබඳතාවේ 55 වැනි සංවත්සර චීන රාජ්‍ය නායක සුබ පැතුම් පණිවුඩ

නපුරු "නියැ" පරදන චීනයේ සම්ප්‍රදායික වසන්ත උත්සවය

වසන්තයේ සාම්ප්‍රදායික ආහාරය-ජ්‍යඕස

සීතල මෙතරම් සුන්දරද



中国国际广播电台僧伽罗语广播部
SINHALA SERVICE CHINA RADIO INTERNATIONAL

2012年第1期（总第23期）
2012 පළමු කලාපය

# 2012 නව වසරේ චීන රාජ්‍ය සභාපති හු චින් තාඕ මහතාගේ සුභපැතුම් පණිවිඩය

ලෝක සාමය සහ සංවර්ධනය වෙනුවෙන් පොදුවේ ප්‍රවර්ධනය කරමු



මහත්වරුනි ,මහත්මියනි සහෝදරවරුනි, මිත්‍රවරුනි:

නව වසරේ සන්ටා නාදය නොබෝ වේලාවකින් ඇසෙනවා. අපි 2012 වසර උදාවීම පොදුවේ පිළිගන්නා මෙම කදිම මොහොතේදී චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය, චීන මධ්‍යම මහජන ගුවන් විදුලිය සහ චීන මධ්‍යම රූපවාහිනී සේවය මගින් ඒ ඒ ජාතීන්ට අයත් සමස්ත චීන ජනතාවටත්, හොංකොං විශේෂ පරිපාලන කලාපයේ ස්වදේශිකයන් සහ මැකාවු විශේෂ පරිපාලන කලාපයේ ස්වදේශිකයන්ටත්,තායිවාන ස්වදේශිකයන් සහ විදේශ ගත ව සිටින චීන ස්වදේශිකයන්ටත් එමෙන්ම ලෝකයේ ඒ ඒ රටවල මිත්‍රවරුන්ටත් සුභ නව වසරක් වේවායැයි මම ඉතාමත් සතුටින් ප්‍රාර්ථනා කරනවා .

2011 වසර චීනයේ 12වැනි පස් අවුරුදු සැළැස්ම ක්‍රියාත්මක වීම ආරම්භ වූ වසරයි. දිගින් දිගටම වෙනස් වෙමින් පවතින සංයුක්ත ජාත්‍යන්තර තත්ත්වයන් මෙන්ම දේශීය ප්‍රතිසංස්කරණය, සංවර්ධනය හා ස්ථාවරත්වය මෙහෙයැවීමේ දැඩි හා බලවත් වගකීම හමුවේ චීන ජනතාව එකම හදවතකින් අධිෂ්ඨානයෙන් යුතු ව ක්‍රියා කර ඊට මුහුණ දෙමින් සිටිනවා. ප්‍රතිසංස්කරණය හා විවෘතභාවය සහ සමාජවාදී. නවීකරණ සංවර්ධන ක්‍රියාදාමය අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් ස්ථිර හා සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක පැවත්වාගැනීම පදනම් කර ගෙන සුසංගත සමාජයක් පූර්ණ ලෙස ගොඩ නැගීමෙහි නව ජයග්‍රහණ අත් කර ගෙන තිබෙනවා. ලෝකයේ විවිධ රටවල් සමඟ හුවමාරු හා සහයෝගතා ශක්තිමත් කරන අතර ලෝක ආර්ථික වර්ධනය සහ මූල්‍ය ස්ථාවරත්වය ප්‍රවර්ධනය කරීම, ගෝලීය ආර්ථික පරිපාලනය යහපත් කිරීම සහ ලෝක අවධානයට ලක් ව ඇති ජාත්‍යන්තර හා කලාපීය ප්‍රශ්ණ විසඳාලීම සඳහා ජාත්‍යන්තර සහයෝගතාවන්ට චීනය උණන්දුවෙන් එක් ව සිටිනවා. මෙය මානව සංහතියේ සාමය හා සංවර්ධනයට නව දායකත්වයක් වෙනවා.

නව වසරේදී අපි ස්ථිරසාරව චීන ලක්ෂණයෙන් හෙබි සමාජවාදී උතුම් ධජය ඔසවා ගෙන ඩෙං සියාඕ පිං න්‍යාය සහ තුන් නිරූපණය යනාදී වැදගත් චින්තනන මාර්ගෝපදේශ වශයෙන් සලකා විද්‍යාත්මක සංවර්ධන සංකල්පය ගැඹුරට ක්‍රියාත්මක කොට ස්ථිර හා වේගවත් ආර්ථික වර්ධනයක් පවත්වා ගෙන, ආර්ථික ව්‍යූහය තැවතත් සැකසීම සහ උද්ධමනය පාලනය කොට සන්සුන්තත්වයකට පත් වී ආර්ථික සංවර්ධන ක්‍රමවේද ප්‍රතිසංස්කරණය හා ආර්ථික ව්‍යූහ සැකසීම වේගවත් කිරීම සඳහා අපි අඛණ්ඩව උත්සාහ දරමින් සිටිනවා. ජන ජීවිත මට්ටම ඉහළ නංවීමට වැඩි අවධානය යොමු කරමින් ආර්ථික සමාජ සංවර්ධන ප්‍රවණතාව තහවුරු කරීම සඳහා අප ක්‍රියාශීලි ව කටයුතු කරනවා.

එක් රටක ක්‍රම දෙකක් , හොංකොං වැසියන් විසින්ම හොංකොං පාලනය කිරීම, මැකාවු වැසියන් විසින්ම මැකාවු පාලනය කිරීම යනාදී ප්‍රතිපත්ති ඉදිරියට ද අනුගමනය කොට හොංකොං හා මැකාවු ජනතාව සමග අත්වැල් බඳගෙන හොංකොං සහ මැකාවු යන කලාප දෙකේ දීර්ඝකාලින සමෘද්ධිය සහ ස්ථාවරත්වය පොදුවේ ආරක්ෂා කරනවා. එක් රටක් ක්‍රම දෙකක් යන මූලික ප්‍රතිපත්තිය අනුගමනය කරන අපි, තායිවාන සමුද්‍රසන්ධි දෙපස සම්බන්ධකමේ සාමකාමී වර්ධනය ඉදිරියට මෙහෙයවා චීන ජාතීන්ගේ මූළික පලප්‍රයෝජනය ආරක්ෂා කරමින් තායිවාන සමුද්‍ර සන්ධි දෙපස ජනතා අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කර සිටිනවා.

සාමය, සංවර්ධනය සහ සහයෝගතාව යුග ඉලක්කයක් මෙන්ම ලෝකයේ විවිධ රටවල ජනතාවගේ ද යහපත පිණිස වෙනවා. වත්මන් ලෝකයේ බහුවිධකරණය හා ආර්ථික ගෝලීයකරණය ගැඹුරට වර්ධනය වෙමින් පවතිනවා. ඒ ඒ රටවල් අතර සම්බන්ධිකරණය දිනෙන් දිනම පුළුල් වෙමින් පවතින නමුත් ලෝක ආර්ථික පුනරුත්ථාපනයෙහි අස්ථිර සාධකයන් ද වර්ධනය වෙමින් පවතිනවා. උණුසුම් ජාත්‍යන්තර හා කලාපීය ප්‍රශ්න ද නොකඩවාම උද්ගත වෙමින් පවතින අතර ලෝක සාමය හා සංවර්ධනයට නව අවස්ථා හා අභියෝග ද මතු වී තිබෙනවා. ලෝක සාමය හා සංවර්ධනය ආරක්ෂා කිරීම හා පොදු සංවර්ධනය පෙළඹවීම පදනම් වන රාජ්‍යතාන්ත්‍රික ප්‍රතිපත්ති චීනය පෙර සේ අකුරට ම පිළිපදිනු ඇති අතර සාමකාමී සංවර්ධන මාවතේ ගමන් කරමින් අන්‍යෝන්‍ය යහපත් හා පොදු ජයග්‍රහණ , විවෘතභාවයේ ක්‍රමෝපාය අනුගමනය කරනු ඇති. සාමකාම. සහජීවන පංචශීල මූළධර්ම මත සෙසු රටවල් සමඟ සුහද සහයෝගතා සබඳතා හා අන්‍යෝන්‍ය යහපත් සහයෝගතා ගොඩ නගා ගෝලීය ප්‍රශ්න නිරාකරණය සඳහා වන ජාත්‍යන්තර සහයෝගතා වලට සකීය ලෙස එක් වීමට චීනය කැමැත්තෙන් සිටී.

ලෝකයේ විවිධ රටවල ජනතාව ඒකාත්මිකව උත්සාහ දරා දිගුකාලීන සාමය හා පොදු සමෘද්ධියක් ලබා කරගත් සුසංගත ලෝකයක් ගොඩ නැගීමේ ක්‍රියාමාර්ගයේදී විවිධාකාර ගැටළු පරදවා නව ජයග්‍රහණ ලබා ගනු ඇති බව මා විශ්වාස කරනවා.

අවසාන වශයෙන්, මම බෙයිජිං නගරයේ සිට ඔබ සැමට නව වසර වාසනාවන්ත , නීරෝගී සම්පන්න වසරක් වේවායි ප්‍රාර්ථනා කරනමි.

හු චින් තාඕ
චීන මහජන සමුහාණ්ඩුවේ සභාපති
2012 ජනවාරි මස 01වන දින

# උදා වූ නව වසර වෙනුවෙන් චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සුබ පැතුම් පණිවුඩය



2012 නව වසර එළඹෙන මෙම මොහොතේ මම චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ චීන ජාත්‍යන්තර විකාශන ජාලය වෙනුවෙන් බෙයිජිං නුවර සිට ඔබ සියලු දෙනාටම නව වසරට මගේ හෘදයංගම ආශීර්වාදය හා සුබ පැතුම පුද කරමි. නව වසරේ සාමය, සතුට සහ වාසනාව ඔබ සමඟ නිරතුරුවම රැඳේවා යන්න අපගේ ප්‍රාර්ථනයයි.

නොබෝ කලකට පෙර, චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පිහිටුවීමේ 70වන සංවත්සරය උත්සවශ්‍රීයෙන් පැවැත්විණ. දෙස් විදෙස් අමුත්තන් මෙන්ම අපේ විශේෂිත ආරාධිත අසන්නන් 20 දෙනකු ද මෙම උත්සවයට එක් වූහ. ලෝ පුරා සිටින අසන්නන්ගෙන් අපගේ 70වන උපන් දිනය වෙනුවෙන් සුබ පැතුම් එවා තිබිණ. එය අපට ලොකු සතුටකි. නිදසුනක් වශයෙන් ජෝර්දාන් අසන්නකු වන Zwyad Salim Agili මහතා අපට මෙසේ ලියා තිබිණ.

'චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පිහිටුවා ගත වූ මෙම වසර 70 ආපසු බැලීම, නව චීනයේ ඉතිහාසය ගැන කියවීමක් සේ දැනෙයි. විෂය මූලික වාර්තා මූලධර්මය අනුගමනය කරන චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ඒ ඒ පාර්ශ්වයන් අදහස් පළ කිරීමේ නිදහසට සහ මානව සංස්කෘතික උරුමවලට ගරු කරයි. චීනයේ පැහැදිලි හා සත්‍ය ස්වරූපය ඔබ සතු බහුමාධ්‍ය හා බහුභාෂික විකාශය ඔස්සේ ලෝකයට හඳුන්වා දෙන බව ඔප්පු වී තිබේ. ඔබ චීනය සහ ලෝක ජනතාව අතර සදාකාලික පාලමක් ඉදි කර තිබේ.'

දයාබර මිත්‍රවරුනි, ඔබගේ මෙවැනි මහඟු ආධාර හා දැඩි සැළකිල්ල, අපේ වර්ධනයට අඛණ්ඩව ශක්තිය ලබා දෙයි. මම ඔබට ඒ පිළිබඳව හදවතින්ම කෘතඥතාව පළ කරමි.

පසුගිය වසරේදී, ලෝක ආර්ථිකය පහත් මට්ටමක පැවති නමුත් චීන ආර්ථිකය තරමක් සීඝ්‍රයෙන් වර්ධනය විණ. චීන ආර්ථිකයේ වර්ධන රටාව පෙරට වඩාත් යහපත් බව පෙනෙයි. එමෙන්ම, ජාත්‍යන්තර වේදිකාවේදී චීනය වගකීමෙන් යුත් රටකි. මෙම වේදිකාවේ මධ්‍යයේ සිටින අපට පළල් දෘෂ්ටියක් හිමි විය යුතුයි. අප ගොඩනැගිල්ල තුළ කැටයම් කරනු ලැබූ 'චීන ස්ථාවරය, ලෝක දෘෂ්ටි කෝණය සහ මානව ගුණාංගය' යන චීන අකුරු අපේ විකාශන සංකල්පය වශයෙන් චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සෑම කෙනකුම තම සිත්හි ධාරනය කර තිබේ.

චීන වර්ධනය ලෝකයේ දැඩි අවධානයට ලක් ව තිබේ. වත්මන් ලෝකයට චීනය ගැන අවබෝධ කර දිය යුතු ය. අප ගුවන් විදුලිය ඵලදායිම ක්‍රම මගින් චීනය ලෝකයට හඳුන්වා දීමට දැඩි වෙහෙසක් ගත්තේ ය. ගත වූ වසරේදී, චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය අභිබවා නව මාධ්‍ය සීඝ්‍රයෙන් වර්ධනය වූ අතර එතෙර කලාපයේ වැඩපිළිවෙළ සක්‍රිය ලෙස ඉදිරියට ගමන් කළේ ය. නුදුරු ලෝකය දෑස් ඉදිරියේ පිහිටා තිබෙන බව අපේ විශ්වාසයයි. පසුගිය වසර ආරම්භයේදී චීන ජාත්‍යන්තර ගුවන් විදුලි විකාශන ජාලය එනම් CIBN නිළ වශයෙන් ආරම්භ කෙරිණ. වසර 70ක ඉතිහාසය සහිත චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය නව මාධ්‍ය ක්ෂේත්‍රයට සම්පූර්ණයෙන් පිවිස ඇතැයි ඉන් සංකේතවත් වෙයි. CIBN අන්තර් ජාල රූපවාහිනී නාලිකාව ඉදි කෙරෙමින් පවතියි. එමෙන්ම අප ගුවන් විදුලිය පිහිටුවීමේ 70වන සංවත්සරය පිළිබඳ සමරු උත්සවය පැවැත්වූ දිනයේදී http://www.t-d.tv/ යන වෙබ් අඩවිය විවෘත කෙරිණ. නුදුරු චීනය ඔබ දෙසවන් ළඟ පිහිටා තිබෙන බව ද අපේ විශ්වාසයයි. පසුගිය නොවැම්බර් මස අගදී, චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ 70වන එතෙර නාලිකාව වන රෝම එෆ් එම් නාලිකාව නිළ වශයෙන් විසුරුවා හැරීම ආරම්භ කෙරිණ.

මෙතෙක්, චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය භාෂා 61කින් පැය 3000කට අධික ප්‍රමාණයක වැඩසටහන් ලෝකයට නිරතුරුවම විසුරුවා හරියි. එතෙර නාලිකා 70ක්, එතෙර මැදිරි 24ක්, එතෙර කලාපීය මූලස්ථාන හා වාර්තාකරණ මධ්‍යස්ථාන 40ක්, ගුවන් විදුලි කොන්ෆියුසියස් මධ්‍යස්ථාන 15ක් සහ අසන්නන්ගේ සංගම් 4112ක් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සතු වෙයි. ගත වූ වසරේදී, අපට ලෝ පුරා අසන්නන්ගෙන් ලැබූ ලියුම් ප්‍රමාණය තිස්දෙලක්ෂ තිස්දහස වාර්තාගත මට්ටමකට ළඟා වීමකි.

ඉතිහාසය දෙස ආපසු හැරී බැලීමේදී, අසීමිත ගෞරවයක් අපට හැඟේ. අනාගතය කරා අපි අපේක්ෂා දල්වා සිටිමු. 2012 නව වසර තුළ, ලෝකයේ බහුවිධ සංස්කෘති අතර සාධාරණ සංවාද, සුසංගත සහපැවැත්ම සහ පොදු සමෘද්ධිය ඉදිරියට මෙහෙයවීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය අඛණ්ඩව වෑයම් දරයි. එමෙන්ම, තොරතුරු සන්නිවේදන හැකියාව සහ සේවා මට්ටම ඉහළ නැංවීමටත් අපි උත්සාහ දරමු. සෑම මිත්‍රයකුටම වර්ණවත් සහ ප්‍රගතිශීලි චීනය පිළිබඳව අවබෝධ කරවීමට අපි ස්වකීය කාර්යභාරය ඉටු කිරීමට කැප වෙමු.

දයාබර මිත්‍රවරුනි, අප මෙම නව වසර පිළි ගන්නෙමු. ඔබ සියලු දෙනාටම සුබ නව වසරක් වේවා කියාත් ඔබේ පවුලට සතුට හා වාසනාව ලැබේවා කියාත් මම නැවත වරක් ප්‍රාර්ථනා කරමි.

වං ගන්නියන්
අධ්‍යක්ෂ ජනරාල්
චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය
2012 ජනවාරි මස 01වන දින

# චීන ශ්‍රී ලංකා රාජ්‍යතන්ත්‍රික සබඳතාව ස්ථාපිත කිරීමේ 55 වැනි සංවත්සරය නිමිත්තෙන් චීන රාජ්‍ය සභාපති හූ චින් තාඕ මහතා විසින් ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙත යැවූ සුබ පැතුම් පණිවුඩය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත ,

චීන මහජන සමුහාණ්ඩුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර රාජ්‍යතන්ත්‍රික සබඳතාව ස්ථාපිත කිරීමේ 55 වැනි සංවත්සරය යෙදෙන අද, චීන රජය සහ චීන ජනතාව වෙනුවෙන් එමෙන්ම පෞද්ගලිකව ද මම ඔබතුමාට සහ ශ්‍රී ලංකා රජයට හා ජනතාවටත් උණුසුම් හා ප්‍රසන්න සුබ පැතුම් පිරිනමමි.

සම්ප්‍රදායික මිත්‍ර අසල්වැසි රටවල් වන චීනය සහ ශ්‍රී ලංකාව අතර දිගු කාලින මිත්‍රත්ව සම්බඳතාවක් තිබේ. රාජ්‍යතන්ත්‍රික සබඳතාව ස්ථාපිත කොට වරස 55ක කාලය තුල ම චීන ශ්‍රී ලංකා දෙරටේ සබඳතාව යහපත්ව හා අඛණ්ඩව වර්ධනය වෙමින් පවතියි. දෙපාර්ශ්වය අතර දේශපාලනමය අන්‍යෝන්‍ය විශ්වාසය නොකඩවාම වර්ධනය වී, ඒ ඒ ක්ෂේත්‍රවල හුවමාරු හා සහයෝගතා දිනෙන් දින ව්‍යාප්ත වී ඇති අතර, ජාත්‍යන්තර හා කලාපීය කටයුතුවලදීත් යහපත් හුවමාරු සහ සම්බන්ධීකරණ පවතියි.

චීන ශ්‍රී ලංකා සම්බඳතාව වර්ධනය කර දෙරට අන්‍යෝන්‍ය යහපත් සහයෝගතා ගැඹුරු කරවීම, චීන රජයේ ස්ථිර ප්‍රතිපත්තියකි. ශ්‍රී ලංකා පර්ශ්වය සමග එක්ව දෙරට අතර ඇති මිත්‍රත්වය හා සහයෝගතාව අඛණ්ඩවම තහවුරු කොට, චීන ශ්‍රී ලංකා අංගසම්පූර්ණ සහයෝගිතා හවුල්කාරී සම්බඳතාවේ සුබවාදී අනාගතයක් පොදුවේ නිර්මාණය කරීම චීනයේ අභිලාෂයයි.

ඔබතුමාට නිරෝගිභාවය හා දීර්ඝායුෂත් ශ්‍රී ලංකාවට හැම අතින්ම සමෘද්ධිය හා සෞභාග්‍යයත් උදා වේවා යයි මම ප්‍රාර්ථනා කරමි.

හූ චින් තාඕ
චීන මහජන සමුහාණ්ඩුවේ සභාපති
2012 පෙබරවාරි මස 7වනදා



## චීන ශ්‍රී ලංකා රාජ්‍යතන්ත්‍රික සබඳතාව ස්ථාපිත කිරීමේ 55 වැනි සංවත්සරය නිමිත්තෙන් චීන අග්‍රාමාත්‍ය වෙන් චියා බොව් මහතා විසින් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය දි.මු.ජයරත්න මහතා වෙත යැවූ සුබ පැතුම් පණිවුඩය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය
ගරු දි.මු. ජයරත්න මැතිතුමා වෙත

චීන මහජන සමුහාණ්ඩුව හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය අතර රාජ්‍යතන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීමේ 55 වැනි සංවත්සරය යෙදෙන අද චීන රජය නියෝජනය කරන මම ඔබතුමාටත් ශ්‍රී ලංකා රජයටත් අවංකව හා සුහදව සුබ ප්‍රාර්ථනා කිරීමට කැමැත්තෙමි.

චීනය සහ ශ්‍රී ලංකාව සුහද අසල්වැසියන් වෙයි . එමෙන්ම මනා සහෝදරත්වයක් ගොඩනැගී තිබේ. දෙරට අතර මනා රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා සහයෝගතාවක් පවතියි.

රාජ්‍යතන්ත්‍රික සබඳතාව ස්ථාපිත කොට වසර 55ක කාලය තුල ම දෙපාර්ශ්වයේ පොදු උත්සාහය යටතේ දෙරටේ සබඳතාව නොකඩවාම ඉදිරියට වර්ධනය වී තිබේ. වර්තමානයේදී චීනය සහ ශ්‍රී ලංකාව අතර දේශපාලන වෙළෙඳ , ආර්ථික සහ මානව සම්පත් යන ක්ෂේත්‍රවල සහයෝගතා නව වර්ධනයක් අත් කර ගෙන තිබේ. ජාත්‍යන්තර කටයුතුවලදීත් යහපත් සහයෝගිතාවක් පවතියි. චීන ශ්‍රී ලංකා සබඳතාව පවතිනුයේ හොඳම ඓතිහාසික වර්ධන අවධියකය. ඉදිරි කාලයේදීත් චීන ශ්‍රී ලංකා සබඳතාව තවත් උසස් මට්ටමකට නංවාලීමට ඔබතුමා සමග අත්වැල් බැඳ උත්සාහ දැරීමට මම කැමැත්තෙමි.

ඔබතුමාට නිරෝගිභාවය හා දීර්ඝායුෂ ලැබේවායි ද ශ්‍රී ලංකාවට හැම අතින්ම සමෘද්ධිය හා සෞභාග්‍යයත් උදා වේවා යයි ද මම ප්‍රාර්ථනා කරමි.

චීනයත් ශ්‍රී ලංකාවත් අතර සුහද සබඳතා දිගුකල් දිනේවා.

වෙන් චියා බොව්
චීන මහජන සමුහාණ්ඩුවේ අග්‍රාමාත්‍ය
2012 පෙබරවාරි මස 7වනදා

## චීන ශ්‍රී ලංකා රාජ්‍යතන්ත්‍රික සබඳතාව ස්ථාපිත කිරීමේ 55 වැනි සංවත්සරය නිමිත්තෙන් චීන විදේශ අමාත්‍ය යාන් චියැ ජී මහතා විසින් ශ්‍රී ලංකා විදේශ අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා වෙත යැවූ සුබ පැතුම් පණිවුඩය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ අමාත්‍ය
ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා වෙත,

චීන මහජන සමුහාණ්ඩුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර රාජ්‍යතන්ත්‍රික සබඳතාව ස්ථාපිත කිරීමේ 55 වැනි සංවත්සරය යෙදෙන අද මම ඔබතුමාට අවංකව හා සුහදව සුබ ප්‍රාර්ථනා කිරීමට කැමැත්තෙමි.

රාජ්‍යතන්ත්‍රික සබඳතාව ස්ථාපිත කොට ගත වූ වසර 55ක කාලය තුලම චීන ශ්‍රී ලංකා දෙරටේ සබඳතාව විධිමත්ව වර්ධන ප්‍රවණතාවක පවතියි. චීන ශ්‍රී ලංකා දෙරට අතර සම්ප්‍රදායික මිත්‍රත්වය තහවුරු වී තිබෙන අතර ඒ ඒ ක්ෂේත්‍රවල සහයෝගතා නොකඩවාම ව්‍යාප්ත වී තිබේ. එමෙන්ම ජාත්‍යන්තර කටයුතුවලදීත් ඵලදායික ව හුවමාරු සහ සම්බන්ධීකරණ පවතියි. ඉදිරි කාලයේදීත් චීන ශ්‍රී ලංකා මිත්‍රශීලි හා සුහද සබඳතාව ශක්තිමත් කොට වර්ධනය කිරීමට ඔබතුමා සමග එක්ව නොපසුබටව උත්සාහ දැරීමට මම කැමැත්තෙමි.

ඔබතුමාට නිරෝගිභාවය හා දීර්ඝායුෂ ලැබේවායි ද ශ්‍රී ලංකාවට හැම අතින්ම සමෘද්ධිය හා සෞභාග්‍යය උදා වේවා යයි ද මම ප්‍රාර්ථනා කරමි.

චීනයත් ශ්‍රී ලංකාවත් අතර සුහද සබඳතාව දිගුකල් දිනේවා.

යාන් චියැ ජී
චීන මහජන සමුහාණ්ඩුවේ විදේශ අමාත්‍ය
2012 පෙබරවාරි මස 7වනදා



# චීනයට එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය යළි ලැබී වසර 40ක් සපිරෙයි

චීනයට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය යළි ලැබීමේ හතළිස් වන සංවත්සරය 2011 ඔක්තෝබර් 25වනදාට යෙදින. ඒ නිමිත්තෙන් චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය සැකසූ වැඩසටහන් පෙළ ඇසුරින් මෙම ලිපිය සකස් කෙරේ මෙම වැඩසටහන් සඳහා අමාත්‍ය දොස්තර රාජිත සේනාරත්න, අමාත්‍ය බන්ධුල ගුණවර්ධන, කලාකීර්ති එඩ්වින් ආරියදාස, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභික රාජා උස්වැටකෙයියාව යන මහත්වරු අදහස් දැක්වූහ.

චීන ශ්‍රී ලංකා මිත්‍රත්වය ශතවර්ෂ දහසයකට වඩා පැරණි ය. චීන ජාතික බෞද්ධ භික්ෂුවක් වූ ෆාහියන් භික්ෂුන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කළේ ක්‍රි.ව. 412 දී ය. බුදු දහම පිළිබඳ කරුණු ගවේෂණයට ශ්‍රී ලංකාවට වැඩම කළ උන් වහන්සේ තැබූ සටහන් අදත් ශ්‍රී ලාංකිකයන් සතු ඉතිහාස මූලාශ්‍රයන්ය. උන් වහන්සේගේම සටහනක තමන් වහන්සේ අනුරාධපුර විහාරස්ථානයකදී පූජාසනයක් මත චීන අවානක් දුටු බව සඳහන් වේ. ඒ අනුව උන් වහන්සේට පෙර සිටම ශ්‍රී ලංකාවට චීන ජාතිකයන්ගේ පැමිණීම සිදු ව ඇති බව පැහැදිලි ය. ශ්‍රී ලංකාවට මුලින් ම ''සීනි'' පැමිණියේ ද චීනයෙනි. චීන නැව්වලින් එන මෙම පැණිරස කුඩු වර්ගයට සීනි කියන්නට සිංහලයා පුරුදු විය. මේ හැරුණු විට තවත් බොහෝ ලක්ෂණ චීනයෙන් ශ්‍රී ලංකාවේ සංස්කෘතියට ඇතුළත් විය. චීන වරාය, චීන කොරටුව, රතිඤ්ඤා වර්ගයක් වන චීන පටස් සහ චීන චට්ටි චීන බලපෑම මත සමාජගත වූ දැ බව සිතිය හැකි ය.

මෙම ඓතිහාසික සම්බන්ධතාව තවදුරටත් ශක්තිමත් කිරීමට වර්තමාන රජයේ විදේශ ප්‍රතිපත්තිය බොහෝ දුරට ඉවහල් වී තිබේ. මේ නිසා චීනයෙන් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ බොහෝසෙයින් වැඩි වී ඇති බව පෙනෙයි. දැනටමත් වැඩ නිම වී ඇති කොළඹ ඉදි වූ අභිනව රංග මණ්ඩපය ඉන් එකකි. එය ආසියාවේ ම පවතින අතිනවීන පහසුකම්වලින් හෙබි රංග ශාලා සංකීර්ණයකි.

මීට වසර 40ට පෙර ශ්‍රී ලංකාව චීනය වෙනුවෙන් පෙනී සිටීම මත ශ්‍රී ලංකාව ලැබූ ප්‍රතිලාභ බොහෝ ය. වර්ෂ 1948දී නිදහස ලැබූ ශ්‍රී ලංකාවට 1955දී එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලැබිණ. එම සංවිධානය පිහිටවනු ලැබුවේ 1945 ඔක්තෝබර්24 වැනි දා ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවන අවස්ථාවේදී පුරෝගාමී වූවන් අතර චීනය ද සිටියේ ය. එම පුරෝගාමී රටවල් පහ වූයේ ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය, ප්‍රංශය, රුසියාව හා චීනයයි. කිසියම් හේතුවක් නිසා පසු කලෙක චීනයේ එක්සත් ජාතීන්ගේ සංවිධාන සාමාජිකත්වය අහිමි කරනු ලැබින. එය ආපසු ලැබුනේ 1971දී ය. එම අවස්ථාවේදී චීනය වෙනුවෙන් හඬක් නැගූ රටවල් අතර ශ්‍රී ලංකාව ප්‍රධාන ය.

අද වන විට ලෝකය පුරා ධන අවපාතයක් මතු ව එයි. නමුත් කෝටි 130ක ජනගහණයක් සහිත ව චීනය වේගයෙන් සංවර්ධනය වෙයි. මේ තත්ත්වය ලෝක බලවතා සේ සැලකෙන ඇමෙරිකාව ද පිළි ගෙන තිබේ. අද චීනය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩල නිත්‍ය සාමාජිකයෙකි.

මෑත ඉතිහාසයේ ශ්‍රී ලංකාව මුල් වරට චීනය සමඟ රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා ඇති කර ගත්තේ 1956දී ය. ඒ දිවංගත අගමැති එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක මැතිඳුන්ගේ වකවානුවේදී ය. පනහ දශකයේ ශ්‍රී ලංකාව සහ චීනය අතර ඇති කර ගත් රබර් සහල් ගිවිසුම ශ්‍රී ලංකා ඉතිහාසයේ කඩඉමකි. චීනය හා ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක රජයන් අතර සුවිශේෂ මිත්‍රත්වයක් පැවතියේ ය. බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව එහි ප්‍රතිඵලයකි. චීන අග්‍රාමාත්‍ය චෞ එන් ලායි මැතිඳුන්ගේ සමයේදී ශ්‍රී ලංකාව සමග මිත්‍රත්වය තීව්‍ර විය. ඉන්දු-චීන අර්බුදයේ මැදිහත්කරුවෙකු ලෙස දෙරට අතර සංහිඳියාවක් ඇති කිරීමට එකල සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය ක්‍රියා කළේ ඒ මිත්‍රත්වය නිසා ය. 1971 ත්‍රස්තවාදී කැරැල්ල පැවති සමයේදී ශ්‍රී ලංකා මුහුද අවට ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමට සහය දුන්නේද චීන රජයය.

කොළඹ නගරයේ ඉහළින් ම පෙනෙන උපරිමාධිකරණ සංකීර්ණය චීනයේ අපිරිමිත මිත්‍රත්වය කියා පාන්නෙකි. අද ශ්‍රී ලංකාවේ සුවිශේෂ මිතුරෙකු බවට පත් ව සිටින චීනය වසරකට එක්සත් ජනපද ඩොලර් බිලියනයකට වඩා ආධාර ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ලබා දෙයි.

තිස්වසරක යුද්ධය නිම කොට සංවර්ධනයේ අරුනළු දකින ශ්‍රී ලංකාවට අද ජාත්‍යන්තර ප්‍රබල රැකවලකු ලෙස චීනය කටයුතු කරයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ශ්‍රී ලංකාවට එරෙහි ව මතු කළ ඇතැම් කාරණාවලදී චීනය ශ්‍රී ලංකා රජය ආරක්ෂා කළේ ය. මේ අනුව වසර 1971දී චීනය වෙනුවෙන් නැගී සිටම කෙතරම් වැදගත් ද යන්න මනාව පැහැදිලි වෙයි.

1949දී මාඕ සේ තුං තුමන් චීනය තුළ ඇති කළ විප්ලවයේ ආශ්වාදය ලෝපුරා ප්‍රගතිශීලි කඳවුරු පැවැති සියලු රටවල් කරා ගලා ගියේ ය. එම ආශ්වාදය ශ්‍රී ලංකාවට ද ඉන්දියාවට ද මැනවින් දැනින. එම නිසා චීනයේ විප්ලවීය සාහිත්‍ය ශ්‍රී ලංකාව තුළ ද ප්‍රචලිත විය. විශේෂයෙන් හැත්තෑවේ

දශකයේදී චීන සාහිත්‍ය ශ්‍රී ලංකා සාහිත්‍ය ක්ෂේත්‍රයට ප්‍රබල බලපෑමක් කළේය.

චීනය එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය නැවත ලබන අවධිය වන විට චීනයේ මහ කොමසාරිස්වරයා වශයෙන් කටයුතු කළේ මහාචාර්ය ගුණපාල මලලසේකරයන් ය. ප්‍රබුද්ධ පඬිවරයෙකු වූ ඒ මහතා ද චීන ශ්‍රී ලංකා මිත්‍රත්වය වඩාත් තීව්‍ර කිරීමට මහඟු මෙහෙවරක් කළේ ය.

වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා චීනයේ ඉපැරණි මිතුරෙකි. බෙයිජිං විදේශ භාෂා විශ්ව විද්‍යාලයේ සිංහල අංශයට අනුබද්ධව සිංහල අධ්‍යයන කේන්ද්‍රයක් පිහිටුවීමට එතුමා නායකත්වය දුන්නේ ය. වසර හැත්තෑවක් පැරණි එම විදේශ භාෂා විශ්ව විද්‍යාලය කලින් කල සිංහල උගත් චීන ජාතිකයන් රැසක් බැගින් බිහි කරයි. දෙරට අතර මිත්‍රත්වය වර්ධනයට මෙය සුවිශේෂී අවස්ථාවකි. වර්තමානයේ ශ්‍රී ලංකාව ආරම්භ කර ඇති යටිතල පහසුකම් නැංවීම ඇතුළු පංචවිධ සංවර්ධන ප්‍රයාමයන්හිදී උපකාර සපයන රටවල් අතර චීනය ඉදිරියෙන්ම සිටින්නේ මෙබඳු හේතූන් මත ය.

වර්තමානයේ ලෝකයේ සියලු රටවල් අතරින් චීනය වේගයෙන් ඉහළ නැඟෙයි. සමස්ථ ලෝක දරිද්‍රතාව පිටුදැකීමේ කාර්යයෙන් හරි අඩක් පමණ චීනය තනිව භාරගෙන සිටියි. මුහුදු පත්ල ද අභ්‍යවකාශය ද ජය ගැනීම එහි නුදුරු ඉලක්කයන් ය. මේ නිසාම ආසියා සහෝදර කුලකයේ අපේම සහෘදයකු ලෙස වේගයෙන් ඉහළ නැඟෙන චීනයට අපේ ශුභාශිංෂන එක් කළ යුත්තේ හද පත්ලෙනි.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ චන්දන තිලකරත්න

(දිනමිණ පුවත් පතේ පළවූ ලිපියකි)



# නපුරු "නියැ" පරදන චීනයේ සම්ප්‍රදායික වසන්ත උත්සවය

චීන ජනතාවගේ සම්ප්‍රදායික උත්සවයක් වන වසන්ත උත්සවය වසරේ වැදගත් ම උත්සවයයි. වසන්ත උත්සව කාලයේ උපන් ගමට ආපසු පැමිණ සමස්ත පවුලේ අය සමඟ එකතු වීම, චීන ජාතිකයන්ගේ පුරුද්දයි. මේ වෙනුවෙන් "ජ්‍යඔස" නමැති හාල් පිටි, මස් සහ එළවලු සහිත ආහාරය ඔවුහු පිළියල කරනවා. මෙම වසරේ වසන්ත උත්සවය ආරම්භ වූයේ මෙම ජනවාරි මාසයේ 23වනදා සිටය. මෙම උත්සවය, අවසන් වූයේ පෙබරවාරි මාස හය වනදාය. වසන්ත උත්සවය චීන සම්ප්‍රදායික ලිත් ක්‍රමයේ නව අවුරුදු උත්සවය ලෙස හැඳින්වෙයි. වසන්ත උත්වසය ගත කිරීම චීන භාෂාවෙන් හඳුන්වන්නේ "ගුවෝ නියැ" යනුවෙනි. වසන්ත උත්සවය සීත සෘතුවේ අවසානය සනිටුහන් කරයි.

චීන ජනතාවගේ වසන්ත උත්සව චාරිත්‍ර වලට දිගුකාලීන ඉතිහාසයක් පවතී. අදාළ ලිඛිත සාක්ෂි අනුව චීනයේ වසන්ත උත්සවයට වසර හාරදහසකට වැඩි ඉතිහාසයක් තිබේ. එය ආරම්භ වූයේ පැරණි චීනයේ සිහි කිරීමේ උත්සවයෙනුයි. ඊට සම්බන්ධ ජන කථා කිහිපයකි. "නියැ" නමැති සත්වයා පිළිබඳ කථාව ඉන් ප්‍රසිද්ධය. පුද්ගලයන්ගේ පරිකල්පනයෙන් බිහි වූ එම සත්වයා පුද්ගලයන්ට අවාසනාව ලබා දෙන නපුරු සත්වයෙක් බව චීන ජනතාව විශ්වාස කරනවා.

"නියැ" කෙසේ ද පරාජය කරන්නේ යන්න කල්පනා කළ චීන ජනතාවට "නියැ" සත්වයාගේ දුබලතාවක් සොයා ගැනීමට හැකි විය. රතු පාට, ගින්දර හා පිපිරුම් හඬට "නියැ" බිය වෙයි. රතු පාට කඩදාසි වලින් තමන්ගේ දොර ආවරණය කරමින් කාමරයේ විදුලිපහන් දල්වා නිවාසේ දොර ඉදිරියේ ගිණි කෙළි දැල් වීම මඟින් "නියැ" නමැති සත්වයා පලවා හරිය හැකි යැයි චීන ජනතාව විශ්වාස කළා. අනතුරුව එම පුරුද්ද දිගටම පුළුල් මට්ටමෙන් ප්‍රසිද්ධ වී චීනයේ සම්ප්‍රදායික උත්සව දිනය බවට පත් විය.

වසන්ත උත්සවයට අදාළ සිරිත් විරිත් ක්‍රියාකාරකම් සාමාන්‍යයෙන් මාසය පුරා ම පැවැත්වෙයි. මිය ගිය මුතුන් මිත්තන් සිහි කිරීම වසන්ත උත්සවයට පෙර සිදු කෙරෙයි. වසන්ත උත්සවයට අදාළ සිරිත් විරිත් රැසකි. දරුවන්ට මිළමුදල් ලබා දීම හා ඥාතීන් අතර අවුරුදු සුභ පැතුම් හුවමාරු කිරීම ඇතුළු සිරිත් ඒ අතර ප්‍රකටය. වසන්ත උත්සවයේ පළමුදා සිට දින පහළොවකින් පසු ප්‍රදීප උත්සවයයි. ඒ දින රාත්‍රියේ විවිධාකාර පහන් කූඩු නැරඹිය හැකිය. වසන්ත උත්සවය අවසන් වන්නේ ප්‍රදීප උත්සවයට පසුවය.

ජ්‍යඔස අනුභව කිරීමේදීත් ඔවුන් අතර විවිධ චාරිත්‍ර තිබෙනවා. ශ්‍රී ලංකාවේ පැටිස් හා සමාන හැඩයෙන් යුත් හාල් පිටි ඇසිරුමක පිළියල වන මෙම ජ්‍යඔස එකක් තුළට කාසියක්, රට කජු ඇටයක් ලොසින්ජරයක් දැමීම ඔවුන්ගේ සිරිතයි. සියලු දෙනා එක්ව අනුභව කරන අවස්ථාවේදී එම විශේෂිත ජ්‍යඔස හමු වූ පුද්ගලයා ඒ පවුලේ වාසනාවන්තයා වෙයි.

වසන්ත උත්සවයේදී චීන ජනතාව අනුගමනය කරන සිරිත් විරිත් විදේශ රටවල ජීවත්ව සිටින එතෙර චීන ජනතාව විසින් ලෝ පුරා ප්‍රසිද්ධ කර තිබෙනවා. චීනයේ සම්ප්‍රදායික වසන්ත උත්සවය උදා වීමේදී විවිධ රටවල රාජ්‍ය නිළධාරින් විසින් විවිධාකාරයෙන් එතෙර චීන ජනතාව අයත් සමාජ වෙත නව අවුරුදු පැතුම් පුද කරනු ලබයි. ඇමෙරිකාවේ නිව්යෝර්ක් ජනපදය චීන වසන්ත උත්සවය පොදු නිවාඩු කාලයක් ලෙසට නම් කර තිබෙනවා. විදේශිකයන්ගෙන් වැඩි පිරිසක් ද වසන්ත උත්සවය නියෝජනය කරන චීන සම්ප්‍රදායික සංස්කෘතියට ගැඹුරු කැමැත්තක් දක්වත.. වසන්ත උත්සව කාලයේ ලෝකයේ ඒ ඒ ප්‍රදේශ වල නව චීන අවුරුදු උත්සව පවත්වනු ලැබේ. චීනයේ ටිබෙට් ස්වයත්තය, හොංකොං හා මැකව් විශේෂ පරිපාලන කලාප සහ තායිවන පලාත යන කලාප මෙන්ම ඉන්දුනීසියාව, මලයාසියාව, පිලිපීනය, සිංග්ගපූරුව හා තායිලන්තය යන රටවල් වල ද මෙම වසන්ත උත්සවය විවිධාකාරයෙන් පැවැත්වෙයි.



# සත්වයින්ගෙන් උපන් චන්ද්‍ර මාස දොළොස

මෙවර වසන්ත උත්සවයත් සමඟ චීනයට උදාවූයේ 'මකරා'ගේ වසරය. මෙය චීන ජාතිකයන්ගේ මහත් අමන්දානන්දයට හේතුවන වසරකි. මකරා යනු චීන ජාතිකයන්ගේ මහත් සම්භාවනාවට ලක්වූ අභිමානවත් මනංකල්පිත සත්වයෙකි. අහස, ජලය හා ගොඩබිම යන ත්‍රිත්ව ඉසව්වල වික්‍රමයන් පාන්නට සමත් මේ සත්වයා කරුණාව, මෛත්‍රිය හා පරෝපකාරය පෙරදැරි කරගත් අපූර්ව සමාජ හිතකාමියකු ලෙස ඔවුහු සළකති.

මකරාගේ වසර උදාවනුගේ වසර දොළහකට වතාවකි. ඉන් අදහස් වනුයේ චක්‍රයක් පරිද්දෙන් ඒ ඒ වසර නම් දොළහකින් හැඳින් වෙන බවයි. චීන රාශි චක්‍රය හැඳින්වනුයේ සත්වයන් දොලොස්දෙනෙකුගේ නම් වලිනි. මෙය ශ්‍රී ලාංකිකයනට මේෂ, වෘෂභ මිථුන, කටක ආදී පිලිවෙළට සමානය චීනයේ රාශි දොළස හැඳින්වනුයේ මීයා, ගවයා, කොටියා, වඳුරා, කුකුලා, බල්ලා, සහ ඌරා ලෙසය. මෙම අනුපිලිවෙල සැකසුනු ආකාරය පිලිබඳ ජනප්‍රවාද රැසක් වෙයි. එම ජනප්‍රවාදවලට අනුව සතුන්ගේ පිළිවල සකසා ඇත්තේ කිසියම් සර්වබළධාරියකු විසින්. ඇතැම් තැනක එය විශ්වයටම අධිරාජයා වූ 'බුද්ධ' ලෙස හැඳින් වේ. සමහර තැනක ශක්‍රදෙවියන්ට සමාන දෙවි කෙනෙකු ලෙස ද පේඩ්ඩ් හෙවත් හරිම්ණ අධිරාජයා ලෙස ද විස්තර වෙයි.

මෙම මහා බලැති පුද්ගලයා විසින් දිනක් මෙම සතුනට ආරාධනා කර තිබේ. එවිට සතුන් පැමිණි පිලිවෙල අනුව අනුපිලිවෙද සැඳුනු බව මෙම කථාවලින් කියැවෙයි. පළමුව බැමිණියේ මීයාය. සතුයට පැමිණීමට නියමිතව තිබුනේ මහා ගංභාවක් අසු කරගෙනය. එහිදී පිහිණීමට නොදත් මීයා ගවයෙකු රවටා උගේ කරමතින් පැමිණ ජයග්‍රහණය කළේය. ඒ සඳහා බළලාගේ උදව් ලබා ගත්තද මීයා විසින් අතරමගදී බළලා ගඟට තල්ලු කළ බව ද ඇතැම් කථාවක කියවේ. බළල් මී වෛරය ආරම්භ වූයේ එතැන් සිටය. මෙම තරඟයේදී ගවයා පැමිණියේ දෙවනුවය. තවත් පිහිනීමේ ශූරයකු වූ කොටිය, තුන්වැනියා, විය. ගලින් ගලට පනිමින් ආ හාවා හතරවැනියා වූ අතර මකරා පැමිණියේ පස්වනුවය. සියලුම සතුන් අභිබවන ලක්ෂණ තිබූ මකරා පස්වැනියා වූයේ අතර මඟදී කරදරයට පත් අයට උපකාර කරමින් පැමිණි නිසාය. අනතුරුව පැමිණියේ අශ්වයායය. බැටලුවා වඳුරා සහ කුකුලා. ජලය මත පාරුවක් තනා එහි නැඟී ආහ. බල්ලා අතරමග දිය කෙලිමින් සිටි අතර ඌරා නිතර ආහාරගැනීමට නතර වීම නිසා ප්‍රමාද වී අන්තිමයා විය.

මෙම සතුන්ගේ චරිත ලක්ෂන අනුව ඒ ඒ වසරට සුවිශේෂ ලක්ෂන හිමිවන බව සාම්ප්‍රදායික චීන ජාතිකයන්ගේ විශ්වාසයයි.



චීන සත්ව රාශි දොලසේ ක්‍රමයට අනුව, මෙම වසර මකරාගෙ වසරයි. ඒ ඒ සත්වයන්ට අයත් වසරවල ඉපදුණු අයට යම් සුවිශේෂ පෞද්ගලික ස්වභාව හිමි වන බව චීන ජාතිකයන්ගේ විශ්වාසයයි.

## 1 මීයාගේ වසර:

1924, 1936, 1948, 1960, 1972, 1984, 1996, 2008




මීයාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාවය:

මීයාගේ වසරේ ඉපදුණු අය දක්ෂයින්ය. ඔවුන්ට සූක්ෂම ප්‍රතිවේධයක් පවතී. නමුත් ඉක්මන් කේන්තිකාරයන්ය. නිතර දැනුම් පිපාසයෙන් පෙලෙන ඔවුන් විරුද්ධ ලිංගිකයන්ගේ ආකර්ෂණය දිනා ගත හැකි පිරිසක් ලෙස සැලකෙනවා.

## 2 ගවයාගේ වසර:

1925, 1937, 1949, 1961, 1973, 1985, 1997, 2009




ගවයාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාවය:

ගවයාගේ වසරේ ඉපදුණු අය උද්‍යෝගිමත්, පරීක්ෂාකාරී, නොපැකිළෙන, ඉවසිලිවන්ත ගුණයෙන් යුක්තය. තම පවුලටත් තම කාර්යයන්ටත් දැඩි සැලකිල්ලක් දක්වන ඔවුන් සමාජ ආශ්‍රයට අදක්ෂ යැයි විශ්වාස කෙරෙනවා.

## 3 කොටියාගේ වසර:

1926, 1938, 1950, 1962, 1974, 1986, 1998, 2010




කොටියාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාය:

දැඩි ස්වයං-විශ්වාසයක් ඇති කොටියාගේ වසරේ ඉපදුණු අය බෙහෙවින් ශක්තිමත්ය. ඔවුන් අනතුරුවලට හා අභියෝගවලට මූණ පැමට බිය නැත. සන්සුන් අය ලෙස සැලකෙන ඔවුහු තමන්ගේ ඉලක්කය හා අරමුණ ඉටු වන තෙක් නොකඩවාම උත්සාහයේ නියැලී සිටිති.

## 4 හාවාගේ වසර:

1927, 1939, 1951, 1963, 1975, 1987, 1999, 2011




හාවාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාවය:

හාවාගේ වසරේ ඉපදුණු අය සිහි කල්පනාවෙන් කටයුතු කරන සෞම්‍ය අයයි. ඔවුන්ට සෞන්දර්ය පිළිබඳව ඉහල අවබෝධයක් හා දැනීමක් තිබේ. ඒ නිසා ඔවුන් තම ගෙදර ලස්සණට සරසන්නත් වෙනත් ඕනෑම කාර්යයක් හොඳින් පිළියෙළ කරන්නත් දක්ෂය. හාවා සේම කරුණාවන්ත මේ අය අන් අයට උදව් කිරීමට කැමති පිරිසක් ලෙස හැඳින් වේ.

## 5 මකරාගේ වසර:

1928, 1940, 1952, 1964, 1976, 1988, 2000, 2012




මකරාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාවය:

ශක්තියෙන් පිරී, තමා ගැන අභිමානයෙන් පසු වන මේ පිරිස පරාජය පිළි ගැනීමට අකැමතිය. සියළු කාර්ය නිවැරදිව ඉටු කිරීමට උත්සාහ කරන ඔවුහු තමන්ගේ ප්‍රතිරූපයටත් දැඩි සැලකිල්ලක් දක්වති. අනුන්ගෙන් උපකාර බලාපොරොත්තු වෙයි. ඉවසිලිවන්තභාවයෙන් අඩුය.

## 6 නයාගේ වසර:

1929, 1941, 1953, 1965, 1977, 1989, 2001, 2013




නයාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාවය:

විචිත්‍ර කථික හැකියාව, දැඩි අධිෂ්ඨානය සහ නිර්මාණශීලිත්වය නයාගේ වසරේ ඉපදුණු අයට හිමි ලක්ෂණයි. මකරාගේ වසරේ ඉපදුණු අය සේම මෙබඳු අය ද සිය පරාජය පිළි ගැනීමට කැමති නැත. නිරන්තරයෙන්ම සැකයෙන් සිටීම ඔවුන්ගේ අඩුපාඩුවකි.

## 7 අශ්වයාගේ වසර:

1930, 1942, 1954, 1966, 1978, 1990, 2002, 2014




අශ්වයාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාවය:

සර්වශුභවාදී, යටත් කළ නොහැකි, සිය අරමුණ ඉටු වන තෙක් උත්සාහ කරන මේ අය විලාසිතාවන්ට අනුව සැරසෙන්නට දක්ෂය. ඔවුන් අන් අයගේ යෝජනා පිළි ගැනීමට අකැමැතිය. තමාගේ ප්‍රතිරූපයට අධික අවධානය යොමු කරන මෙබඳු අයට සකසුරුවම් ආකාරයට ජීවිතය ගත කිරීම අසීරුය.

## 8 බැටළුවාගේ වසර:

1931, 1943, 1955, 1967, 1979, 1991, 2003




බැටළුවාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාවය:

සිහි කල්පනාවෙන් කටයුතු කරන බැටළුවාගේ වසරවල ඉපදුණු අයට ඕනෑම අවස්ථාවක හෝ අසීරුතාවකදී සාර්ථකව හැසිරීමේ හැකියාව තිබේ. ස්ථිර ස්වභාවය හිමි ඔවුහු අසීරුතාවන්ට හා අභියෝග යන්ට නිර්භයව මූණ පාති. ඔවුන් මුරණ්ඩුය. අනුන්ට උපකාර කිරීමට කැමතිය. කරුණාවන්ත පුද්ගලයන් වන ඔවුන් පරිපූර්ණ අඹුවක හෝ සැමියෙකු වන බව විශ්වාස කෙරේ.

## 9 වඳුරාගේ වසර:

1932, 1944, 1956, 1968, 1980, 1992, 2004




වඳුරාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාවය:

වඳුරාගේ වසරේ ඉපදුණු අය ධෛර්යසම්පන්න, ප්‍රාණවත්, තරගකාරීත්වයකින් යුතු අයයි. අලුත් දේවලට දැඩි ආශාවක් දක්වති. හැම විටම ඔවුන් අලුත් දැනුම ලබා ගැනීමේ ආශාවෙන් සිටිති. ඔවුන්ට විස්මයජනක මතක හැකියාවක් තිබේ. අනුන්ගෙ විශ්වාසය ලෙහෙසියෙන් දිනා ගැනීමට ඔවුන්ට හැකිය. චංචල ගතියෙන් යුත් ඔවුන් අපරීක්ෂාකාරී අය ලෙස හැඳින් වේ.

## 10 කුකුළාගේ වසර:

1933, 1945, 1957, 1969, 1981, 1993, 2005




කුකුළාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාවය:

කුකුළාගේ වසරවල ඉපදුණු අය තමන්ටම සුවිශේෂ ශෛලියකින් සැරසීමට කැමතිය. වර්ණය ගැන ඔවුන්නට හොඳ අවබෝධයක් තිබේ. ඔවුන් චතුර කථිකයන්ය. තම කතාවෙන් අනුන් කැමති කරවීම ඔවුන්ගේ දක්ෂකමකි. ඔවුහු සිය සැබෑ අදහසට අනුව කතා කරති. වගකීම් දැරීමට කැමතිය. කුසීතයන් ලෙස සිටින අය දැඩි ලෙස හෙළා දැකීම ඔවුන්ගේ සිරිතය.

එල්ල විය හැකි බලපෑම නොතකා යමක් හෝ පුද්ගලයකු කෙරේ ඇති අප්‍රසාදය වහාම පළ කරති. මේ අය අහංකාරය වළක්වා ගැනීමට උත්සාහ කළ යුතුය.

## 11 බල්ලාගේ වසර

1934, 1946, 1958, 1970, 1982, 1994, 2006




බල්ලාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාවය:

මිතුදමටත් ප්‍රේමයටත් ඉතා අවංක වන බල්ලාගේ වසරේ ඉපදුණු අය තමා ගැන නොතකා ආදරය කරන පුද්ගලයන්ට සිදු විය හැකි හානි වැළැක්වීමට උත්සාහ කරති. තමන්ගේ යහපත සඳහා අපකීර්තිමත් ක්‍රියාවල යෙදෙන්නට දැඩි ලෙස අකැමැතිය.

බල්ලාගේ වසරේ ඉපදුණු අය පහසුවෙන්ම කලබල වෙති. අනුන්ව විවේචනය කිරීමට කැමති වීම ඔවුන්ගේ අඩුපාඩුවකි.

## 12 ඌරාගේ වසර

1935, 1947, 1959, 1971, 1983, 1995, 2007




ඌරාගේ වසරේ ඉපදුණු අයගේ පෞද්ගලික ස්වභාවය:

ඌරාගේ වසරේ ඉපදුණු අය සර්වශුභවාදී පිරිසකි. මුදල් හම්බ කිරීම ඔවුන්ට ගැටළුවක් නොවේ. ඔවුන් අවංකය, සෘජුය. සුළු වාසියට වාද විවාද ඇති කර ගන්නේ නැත. ඌරාගේ වසරේ ඉපදුණු කාන්තාවන් විශේෂයෙන් තමන්ගේ පවුලේ කාර්ය ක්‍රමානුකූලව පිළියෙළ කර ගැනීමට දක්ෂය.

බොහෝ කරුණාවන්තයන් වන ඌරාගේ වසරේ ඉපදුණු අය ලෙහෙසියෙන් අනුන් විසින් වංචා කරනු ලැබීමේ ප්‍රවණතාවක් පවතී. සැහැල්ලු ජීවිතයක් ගත කිරීමට කැමති ඔවුන් සමහර විට කම්මැලියන් සේ පෙනෙයි.

# ජ්‍යඔස

චීන වසන්ත උත්සවය චීනයේ සාම්ප්‍රදායික අලුත් අවුරුදු උත්සවය වන මෙය සමස්ථ චීනයේ මෙන්ම ටිබෙට් ස්වායත්තය, මැලේසියාව, සිංගප්පූරුව, තායිවාන් පළාත ආදී ප්‍රදේශ වල හා රටවල ඉතා ඉහළින් සැමරෙයි. අපේ කිරිබත් මෙන් බහුලව උතුරු චීන වැසියන් වසන්ත උත්සවය සමයේ පිළියෙළ කරන සාම්ප්‍රදායික ආහාරයකි ජ්‍යඔසඃඎමපචකසබට–. මෙය ඉතා රසවත් මෙන්ම පෝෂ්‍යදායක ආහාරයකි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල අංශයේ වැඩසටහනක් වෙනුවෙන් අපි ජ්‍යඔස පිළියෙල කරන ආකාරය ගැන සජීවී අත්දැකීමක් ලැබුවෙමු. මෙම අත්දැකීම ලැබුවේ සිංහල අංශයේ සූප වැඩසටහන් භාර සුනිමලීගේ නිවසේදී. ඉතා දක්ෂ සූපවේදියකු වන ඇගේ පියා වං වෙයිපිං මහත්මයා අපට ජ්‍යඔස හදන ආකාරය පැහැදිළි කළේය. මෙම අවස්ථාවට අප සමඟ චීනයේ සිටින වෛද්‍ය ශිෂ්‍යාවක වන පූර්ණිමා ද වුවාය. රිවි සරසි චීන සූප ශාස්ත්‍ර පාඨකයන් වෙනුවෙන් ජ්‍යඔස පිසින ආකාරය අද අපි ඔබ වෙත ගෙන එන්නෙමු.

අවශ්‍යය ද්‍රව්‍ය

හාල් පිටි ග්‍රෑම් 500

අඹරා ගත් උරු මස් හෝ වෙනත් මස් වර්ගයක් ග්‍රෑම් 250

ගෝවා ග්‍රෑම් 500

ඉගුරු

ලීක්ස් කැබලි ග්‍රෑම් 50

සුදු ළූණු බික් 5-6

සෝයා සෝස් මේස හැඳි 1

තල සෝස් මේස හැඳි 1

ලුනු

අවශය නම් රස කාරක ස්වල්පයක්

සාදන ක්‍රමය

1 තලාගත් සුදුළූණු ඉගුරු සහ ලීක්ස් කැබලි, අඹරා ගත් මස් වලට එකතු කරන්න.

ඊට සෝයා සෝස්, තල සෝස්, ලුනු, අවශය නම් රස කාරක ස්වල්පයක් ද එකතු කර සුවඳ විහිදෙන තුරු ඉතා හොඳින් මිශ්‍ර කරන්න.

2 අනතුරුව හාල් පිටි වලට ඇල් වතුර ටික ටික දමමින් අතේ නොඇලවෙන තරමට ඉතා හොඳින් අනා ගෙන භාජනය වසා ටික වේලාවක් තබන්න.

3 දැන් චීන ගෝවා ගෙඩිය ඉතා සිහින්ව කපා ගන්න. කපන අතර වාරයේ දී ඊට ලුනු කුඩු ටිකක් ඉසින්න. එවිට ගෝවා වල ඇති වතුර පහසුවෙන් ඉවත්කර ගත හැක. ඊළගට කපාගත් ගෝවා කපු රෙද්දක ඔතා මිරිකමින් වතුර ඉවත් කරන්න. පසුව එම ගෝවා ද මස් මිශ්‍රණයට එකතු කර ඉතා හොඳින් කලවම් කරන්න.

4 දැන් අනා ගත් හාල් පිටි මිශ්‍රනය කොටස් 4 කට කපා ගන්න. පසුව ලෑල්ලක් මතට පාන් පිටි ස්වල්පයක් ඉස පිටි මිශ්‍රනයෙන් කොටසක් ගෙන හොඳින් අනමින් එය ක්‍රම ක්‍රමයෙන් දිගට රෝල් කරගෙන වලල්ලක් ආකාරයට සකස් කර ගන්න. ඉන්පසු එය අඟල බැගින් සමාන කැබලි වලට කපා ගෙන එකි නෙක ඇල නොවෙන සේ ඒ මත පිටි ස්වල්පයක් තවරන්න.







5 ඊළඟට ඒ එක් එක් කැබැල්ල එක් වරක් බැගින් අත්ලෙන් තද කර තලා ගන්න.

6 පසුව එම තලා ගත් රවුම් පෙත්ත එක අතකින් අල්ල ගෙන ලී රෝලයක කෙලවරින් පෙත්ත වටේට රෝල් කරමින් පුංචි පපඩමක් සේ සකස් කර ගන්න.

7 දැන් පපඩම හැඩයේ පිටි පෙත්ත මතට මස් මිශ්‍රණයෙන් ටිකක් තබා එය දෙකට නවා කවාකාර කොටසේ මැද රූපයේ ආකාරයට ඇඟිලි දෙකෙන් තද කර ගන්න. ඊළඟට දෙපැත්තෙන් ඇතුලට නවා ගන්න. ඉන් පසු මස් මිශ්‍රණය එළියට නොඑන සේ කවාකාර කොටස රැලි ගන් වමින් පැටිස් එකක් හැඩයට ඇඟිලි වලින් තද කර ගන්න.

8 මේ ආකරයට සියල්ල සකස් කර ගත් පසු ලිප මත තැබූ උතුරන වතුර භාජනයකට ජ්‍යඔස දමන්න. පසුව භාජනය වහන්න. ඒ අතර වාරයේ වරින් වර හැඳි ගාන්න. එම වතුර උතුරන විට නැවත ඊට ඇල් වතුර කෝප්පයක් එකතු කර හැඳි ගාන්න. ඒ වතුරද උතුරන විට යළි ඇල් වතුර කෝප්පයක් මිශ්‍රකර විනාඩි 15-20ක් අතර කාලයක් තම්බා ගන්න. මෙසේ ඇල් වතුර එකතු කිරීමෙන් ජවොස වඩාත් සුමුදු වේ. තම්බා ගත් ජවොස භාජනයකට දමන්න. දැන් ජවොස පිළියෙළ කර අවසානයි. ඔබ කැමති නම් එය සෝයා සෝස් සමඟ ද රස බැලිය හැක. උණුසුම් ජවොස ප්‍රනීත රසක් ගෙන දෙයි.

අපගේ එම වැඩසටහන් අන්තර් ජාලය ඔස්සේ ඔබට සවන් දිය හැකි.

අපේ වෙබ් ලිපිනය

http://sinhalese.cri.cn







# සීතල මෙතරම් සුන්දරද....



ශීත ඍතුවේ නිමාව කියා පාමින් වසන්ත සිරියෙන් මුළු චීනයම එකළු වී ඇත නමුදු චීනයෙන් තවමත් සීතල දේශගුණය පහව ගොස් නැත. වසරේ වැඩිම සීතල ජනවාරි මාසයේදී ය. දැඩි සීත දේශගුණයක් පවතින ඊශාන දිග චීනයේ හලුන්ජියාන් පළාතේ හර්බින් නගරය සීතල නිසාම ලෝකවාසීන්ගේ අවධානය දිනා ගෙන සිටී. ලොව හතර වන විශාලතම අයිස් සහ හිම කැටයම් උත්සවය පැවැත්වෙන්නේ හර්බින් නගරයේය. 1963 වසරේ දී ආරම්භ වූ හර්බින් අයිස් සහ හිම කැටයම් උත්සවයට වසර 28ක ඉතිහාසයක් ඇත.

හර්බින් අයිස් සහ හිම ලෝක උද්‍යානය ද 1999 වසරේදී ආරම්භ විය. වසරක් පාසා පැවැත්වෙන මෙම උත්සවය 13 වන වරට පසුගිය ජනවාරි මාසයේ 5 වනදා ආරම්භ වුණි. රුසියාවට මෙන්ම මොන්ගෝලියාවට ද සම්පව හර්බින් නගරය පිහිටා ඇත. එමෙන්ම එය සයිබීරියාව දෙසින් හමන සීත සුළඟට ඍජුවම මුහුණ දෙන නගරයකි. ග්‍රීස්ම කාලයේ දී වුවද හර්බින් හී උපරිම උෂ්ණත්වය 22°C පමණි. අපි ද හර්බින් සිරිය අත් විඳින්නට සිතුවෙමු. අපේ කණ්ඩායමේ තිදෙනෙක් වූහ. මමත්, චීනයේ ශ්‍රී ලාංකික වෛද්‍ය ශිෂ්‍යාවක වන මින්දිකා ඉද්දගොඩ සහ ඉන්දියානු මිත්‍රයකු වන අනිල් පාන්ඩේය. පසුගිය 22 වනදා සවස බෙයිජිං දුම්රියපළෙන් අපි ගමන ආරම්භ කළෙමු. එවිට බෙයිජිං උෂ්ණත්වය -6°Cක් විය. අපි ජීලින් (Jilin) චන්ග්චුන් (Changchun) පසු කරගෙන ක්‍රමක් ක්‍රමයෙන් හර්බින් දෙසට ගමන් කළෙමු. අප කාගෙත් දෙඇස් යොමුව තිබුණේ දුම්රියේ සටහන් වන කාළගුණ දත්ත තිරය දෙසටයි.

අපි රාත්‍රි 11:30 වන විට හර්බින් නගරයට ළඟා වුණෙමු. එවිට දුම්රිය තුල උෂ්ණත්වය 23°Cක් ලෙසත් ද බාහිර උෂ්ණත්වය -25°C ලෙසත් ද සටහන්ව තිබුණි. ඒ මොහොත වන විට චීන වසන්ත උදාවට ඔන්න මෙන්න ව තිබුණි. අපි තිදෙනාම එතෙක් මෙතරම් සීත අත්දැකීමක් ලබා නොසිටියෙමු. බිය මුසු වූ ආශාව ප්‍රීතියට හිතේ ධෛර්‍යය ද එකතු කර ගනිමින් දුම්රියෙන් බැස්සෙමු. මුහුණට එක් වරම දැණුන සීතල මට අදහා ගත නොහැකි විය. දුම්රිය පොළෙන් පිටත ඇස් අදහා ගත නොහැකි තරම් දර්ශනීය මල් වෙඩි වර්ෂාවකි. රතික්ඤා හඬින් ගිගුම් දෙන හර්බින් නගරයේ සීතල මට මොහොතකට අමතක විය. දුම්රිය පොළ ඉදිරිපිට වෛවර්ණ ආලෝකයෙන් අලංකාර වූ අයිස් නිමැවුම් විය.

පසු දා උදෑසන හර්බින් නගර මධ්‍යයට අපි ගියෙමු. දිය රැළි සරැලි නගමින් හර්බින් නගරය මැදින් ගලා යන මහා සොන්ග්හුවා (Songhua) ගඟ රැළි පිට රැළි නැඟූ අයුරින්ම නිහඬව නිසලව ගල් ගැසී බලා සිටී. මහා සොන්ග්හුවා ගඟ සීතලට මුළුමනින්ම මිදී ඇත. ඒ වන විට එහි උෂ්ණත්වය -30°Cක් විය. ගඟ මැද මහා සැණකෙළියකි. එහි ඇවි ද යන මිනිසුන් මෙන්ම හිම කරත්ත ඇඳ ගෙන යන සුනඛයෝ අශ්වයෝ හැම තැනම වූහ. අපි ද ගඟ මැදට ඇවි ද ගියෙමු. අඩි එක හමාරක් පමණ ඝනකමට ජලය අයිස් තට්ටුවක් ලෙස මිදී ඇත. ඊට ගැඹරින් ඇති ජලය කිසිසේත්ම නොපෙනේ. දිය මිදුණු ගංඟා මත ඇවිද යාම අවදානම්ය. එහෙත් මෙතරම් ඉතා දැඩි සීතලක් හමුවේ (-30°C) එතරම් අවදානමක් පැන නගින්නේ නැත. අයිස් තට්ටුව එතරම්ම ඝනය. අයිස් ක්‍රීඩා වල නිරත වන ලොකු කුඩා හැම දෙනාම සීතල සිරිය විඳින අයුරු නෙතට සිතට අරුම පුදුම රසයක් විය.

ඒ අතරේ ගඟ මැද යමක් සිදු වෙමින් තිබුණි. අයිස් මිදුනු ගඟ මැද පිහිනුම් තටාකයකි. එහි එහා මෙහා පිහිනන ගැහැණු පිරිමි සැබෑ මිනිසුන්ම වීම පුදුමයකි. ගඟ මතුපිට ඇති අයිස් තට්ටුව ඉවත් කර පිහිනුම්



තටාකය සකස් කර ඇත. එම චීන මෙන්ම රුසියානු ජාතික පිහිනුම්කරුවන් දැඩි ශිත ජලයේ පිහිනීම පිළිබඳ විශේෂ පුහුණුවක් ලැබූවන් වේ. මෙය ශීත ඍතුවේ හර්බින් වල ප්‍රකට ඉසව්වකි. ඒ හැරුණු විට නේකවිද අයිස් ක්‍රීඩා එහි විය.

අපි එහි සියල් සිරි නරඹා පිටව ගියේ තවත් ගමනාන්තයකටය. නගරයේ තැනින් තැන ඇති තාප්ප මූර්ති මහා දොරටු සියල්ල අයිස් වලින් නිමවා තිබුණි. අපි ක්‍රමයෙන් හවස හතර පමණ වන විට හර්බින් අයිස් සහ හිම ලෝක උද්‍යානය වෙතට ළඟා වුණෙමු. බැලූ බැල්මට මහා බලකොටුවක පෙනුමකි. අවට



කෙමෙන් කෙමෙන් අඳුරු වෙත්ම පාට පාට විදුලි බුබුළු වලින් අයිස් ගොඩනැගිලි ආලෝකමත් විය. දවස පුරා සීතලෙන් හෙම්බත්ව සිටි අපි තිදෙනා ඉදිරිපිට ඇති අවන්හලකට ගොඩ වැදී උණුසුම් කෝපි කෝප්පයක රස බැලුවෙමු. අයිස් ලෝකයේ සිරිය රිසි සේ විඳින්නට එය පෙර සූදානමක් විය. අනතුරුව අපි කඩමුඩියේ ප්‍රවේශ පත්‍ර ගෙන ඇතුළු වුනෙමු. බැලූ බැලූ අත වෛ වර්ණ විදුලි බුබුලින් සැරසූ අයිස් ගොඩනැගිලි. අයිස් ගස් කොළන් අයිස් සතුන් මෙකී නොකී සෑම සියළු දේම එහි විය. දොරටුව අභියසම ඇත්තේ දැවැන්ත හර්බින් බිර බෝතලයකි. හර්බින් බිර චීනයේ මෙන්ම විදේශිකයන් අතර ද ජනප්‍රිය පානයකි. එහි උස මීටර්14ක් පමණි. මෙම අයිස් උද්‍යානයේ චීනයේ ප්‍රකට ගොඩනැගිලි අකෘති කිහිපයක්ම විය. තහනම් මාළිගය, බෙර කුළුණ, දාගැබ් කුළුණ, බැංකු ගොඩනැගිල, බුද්ධ ප්‍රතිමා, අයිස් පහන් කූඩු, දිය ඇලි ආදී විය. එම ගොඩනැගිලි වල ඉහළට ගමන් කළ හැකි අයිස් පඩි පේළි ද විය. ඒ මත සිහින් රතු පලසක් ද අතුරා තබිණ. උද්‍යාන භූමියේ පොළොවද මුළුමනින්ම අයිස් වලින් සකසා තිබුණි. මාද මගේ යෙහෙළිය මින්දිකා ද කිහිපවරක් ඇද වැටුණ නමුත් එය සතුටක් මිස වේදනාවක් නොවිය. එය තරමක් සුලබ දසුනක් ද විය. අයිස් ගොඩනැගිලි අතරින් ඈතින් දිස් වූයේ හිම කඳු යායකි. හිමෙන් තැනූ බුද්ධ ප්‍රතිමා අභියස වන්දනා මාන කරන පිරිස නෙතට ප්‍රිය දසුනක් විය. කළු ගල් ලී ඇණ මුරුච්චි කිසිවක් කොතනක වත් අපට දකින්නට නොලැබුණි. සොන්ග්හුවා්ඃදබටයම්–ග හේ මිදුනු අයිස් කැබලි කපා මේ සියල්ල නිර්මාණය කර ඇත. පසුගිය දෙසැම්බර් මාසයේ දී මෙවර ඉදිකිරීම් ආරම්භ කොට ඇති අතර එය නැරඹීමට ද ජනතාවට අවස්ථාව ලැබිණ. ලේසර්තාක්ෂණය ඔස්සේ අයිස් කැට මැදට වෛවර්ණ විදුලි බුබළු සවි කර කර ඇත. අපි උද්‍යාන භූමියේ හිම කඳු දෙසට ගියෙමු. හිම කඳු පෙළ පැයකට වරක් දර්ශනීය නර්ථන වේදිකාවක් බවට පත්වේ. ඝන අඳුර, සුදු පාට හිම, විදුලි ආලෝකකරණය සමඟ මුසු කර තිබූ අතර හිම ක්‍රීඩකයන්ගේ ක්‍රීඩාශීලී මෙන්ම නර්ථනශීලී දස්කම් විස්කම් නාට්‍යානුසාරයෙන් ප්‍රේක්ෂකයන්ට ගෙන ආවේ අමරණීය රසයකි. ඉතා ඉහළ තාක්ෂණික ක්‍රමවේදයන් එයට එක් කර තිබුණි. ඇසි පිය නොහෙලා එදෙස බලා සිටි මට සීතල නොදැනී ඇසට උණුසුම් කඳුළු ගලා ආවාය. සංදර්ශනය අවසානයේ දර්ශනීය මල්වෙඩි වැස්සක් හිම කඳු අතරින් දිස්විය. මෙවන් දසුනක් සැබෑ නෙතකට අදහන්නට මෙන්ම දරාග න්නට ද බැරි තරම් විය. අයිස් ලෝක උයනේ පැය 5ක්, 6ක් ගත කළ බවක් අපිට කිසිසේත් නොදැණුනි. එයින් නික්ම එන මොහොතේ සීතල මෙතරම් සුන්දරදැයි මට සිතුනි.

අනෝජා දිසානායක චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය, බෙයිජිං



# SRI LANKA DESK CALENDAR - 2012

## BUDDHIST ERA 2555 – 2556

### JANUARY

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| 30 | 31 | * | * | * | * | 1 |
| 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
| 16 | 17 | 18 | 19 | 20 | 21 | 22 |
| 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 09 | ○ | 13 00 |
| 16 | ☾ | 14 38 |
| 23 | ● | 13 09 |
| 31 | ☽ | 09 40 |

### FEBRUARY

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| * | * | 1 | 2 | 3 | 4 | 5 |
| 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 |
| 20 | 21 | 22 | 23 | 24 | 25 | 26 |
| 27 | 28 | 29 | * | * | * | * |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 08 | ○ | 03 24 |
| 14 | ☾ | 22 34 |
| 22 | ● | 04 05 |

### MARCH

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| * | * | * | 1 | 2 | 3 | 4 |
| 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
| 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 |
| 19 | 20 | 21 | 22 | 23 | 24 | 25 |
| 26 | 27 | 28 | 29 | 30 | 31 | * |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 01 | ☽ | 06 51 |
| 08 | ○ | 15 09 |
| 15 | ☾ | 06 55 |
| 22 | ● | 20 07 |
| 31 | ☽ | 01 11 |

### APRIL

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| 30 | * | * | * | * | * | 1 |
| 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
| 16 | 17 | 18 | 19 | 20 | 21 | 22 |
| 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 07 | ○ | 00 49 |
| 13 | ☾ | 16 20 |
| 21 | ● | 12 48 |
| 29 | ☽ | 15 27 |

### MAY

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| * | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 |
| 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 |
| 28 | 29 | 30 | 31 | * | * | * |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 06 | ○ | 09 05 |
| 13 | ☾ | 03 17 |
| 21 | ● | 05 17 |
| 29 | ☽ | 01 46 |

### JUNE

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| * | * | * | * | 1 | 2 | 3 |
| 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |
| 18 | 19 | 20 | 21 | 22 | 23 | 24 |
| 25 | 26 | 27 | 28 | 29 | 30 | * |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 04 | ○ | 16 42 |
| 11 | ☾ | 16 11 |
| 19 | ● | 20 32 |
| 27 | ☽ | 09 00 |

### JULY

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| 30 | 31 | * | * | * | * | 1 |
| 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
| 16 | 17 | 18 | 19 | 20 | 21 | 22 |
| 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 04 | ○ | 00 22 |
| 11 | ☾ | 07 18 |
| 19 | ● | 09 54 |
| 26 | ☽ | 14 26 |

### AUGUST

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| * | * | 1 | 2 | 3 | 4 | 5 |
| 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 |
| 20 | 21 | 22 | 23 | 24 | 25 | 26 |
| 27 | 28 | 29 | 30 | 31 | * | * |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 02 | ○ | 08 57 |
| 10 | ☾ | 00 25 |
| 17 | ● | 21 24 |
| 24 | ☽ | 19 24 |
| 31 | ○ | 19 28 |

### SEPTEMBER

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| * | * | * | * | * | 1 | 2 |
| 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| 17 | 18 | 19 | 20 | 21 | 22 | 23 |
| 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 08 | ☾ | 18 45 |
| 16 | ● | 07 41 |
| 23 | ☽ | 01 11 |
| 30 | ○ | 08 49 |

### OCTOBER

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| 15 | 16 | 17 | 18 | 19 | 20 | 21 |
| 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 |
| 29 | 30 | 31 | * | * | * | * |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 08 | ☾ | 13 03 |
| 15 | ● | 17 32 |
| 22 | ☽ | 09 02 |
| 30 | ○ | 01 19 |

### NOVEMBER

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| * | * | * | 1 | 2 | 3 | 4 |
| 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
| 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 |
| 19 | 20 | 21 | 22 | 23 | 24 | 25 |
| 26 | 27 | 28 | 29 | 30 | * | * |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 07 | ☾ | 06 06 |
| 14 | ● | 03 38 |
| 20 | ☽ | 20 01 |
| 28 | ○ | 20 16 |

### DECEMBER

| M | T | W | T | F | S | S |
|---|---|---|---|---|---|---|
| 31 | * | * | * | * | 1 | 2 |
| 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| 17 | 18 | 19 | 20 | 21 | 22 | 23 |
| 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 |

| Date | Phase of the moon | Time |
|---|---|---|
| 06 | ☾ | 21 01 |
| 13 | ● | 14 12 |
| 20 | ☽ | 10 49 |
| 28 | ○ | 15 51 |

## PUBLIC, BANK, MERCANTILE AND FULL MOON POYA HOLIDAYS – 2012

(Subject to Variation)

| | | | | |
|---|---|---|---|---|
| January | 08 | Sunday | – | Duruthu Full Moon Poya Day*† |
| January | 15 | Sunday | – | Tamil Thai Pongal Day*†‡ |
| January | 16 | Monday | – | Additional Bank Holiday† |
| February | 04 | Saturday | – | National Day*†‡ |
| February | 05 | Sunday | – | Milad-Un-Nabi (Holy Prophet's Birthday) *†‡ |
| February | 07 | Tuesday | – | Navam Full Moon Poya Day*† |
| February | 10 | Friday | – | Additional Bank Holiday† |
| February | 20 | Monday | – | Maha Sivarathri Day*† |
| March | 07 | Wednesday | – | Medin Full Moon Poya Day*† |
| April | 06 | Friday | – | Bak Full Moon Poya Day*† |
| | | | | Good Friday*† |
| April | 12 | Thursday | – | Day prior to Sinhala and Tamil New Year Day*†‡ |
| April | 13 | Friday | – | Sinhala and Tamil New Year Day*†‡ |
| May | 01 | Tuesday | – | May Day*†‡ |
| May | 05 | Saturday | – | Wesak Full Moon Poya Day*† |
| May | 06 | Sunday | – | Day following Wesak Full Moon Poya Day*†‡ |
| May | 07 | Monday | – | Additional Bank Holiday† |
| June | 04 | Monday | – | Poson Full Moon Poya Day*† |
| July | 03 | Tuesday | – | Esala Full Moon Poya Day*† |
| August | 01 | Wednesday | – | Nikini Full Moon Poya Day*† |
| August | 19 | Sunday | – | Id-Ul-Fitr (Ramazan Festival Day)*† |
| August | 31 | Friday | – | Adhi Binara Full Moon Poya Day*† |
| September | 29 | Saturday | – | Binara Full Moon Poya Day*† |
| October | 26 | Friday | – | Id-Ul-Alha (Hadji Festival Day)*† |
| October | 29 | Monday | – | Vap Full Moon Poya Day*† |
| November | 13 | Tuesday | – | Deepavali Festival Day*† |
| November | 27 | Tuesday | – | Il Full Moon Poya Day*† |
| December | 25 | Tuesday | – | Christmas Day*†‡ |
| December | 27 | Thursday | – | Unduvap Full Moon Poya Day*† |

* **Public Holidays** † **Bank Holidays** ‡ **Mercantile Holidays**

**All Saturdays are Bank Holidays.**

| සිංහල වැඩසටහන් | කොළඹ වේලාව | |
|---|---|---|
| CRI-Srilanka FM 102 | 11:30-- 13:30 | 17:30-- 19:30 |
| කෙටි තරංග මීටර් 49.18(කිලෝහර්ට් 6100) 31.6( කිලෝහර්ට් 9490) 30.61(කිලෝහර්ට් 9745) 25.21(කිලෝහර්ට් 11900) | 19:30-- 20:30 | 05:30-- 06:30 |

CHINA RADIO INTERNATIONAL
P.O.BOX,4216,BEIJING P.R.CHINA100040
SINHALA SERVICE CRI-10
E-mail:wangxiaodong@cri.com.cn
http://sinhalese.cri.cn